මගේ අංකය: JSC/SEC/CIR/2020

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 440

සියළුම මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත

<u>ළමුන් පාර්ශවකරුවන් වන නඩු කටයුතුවලදී ඔවුන් මුහුණ දෙන ගැටළු</u>

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ඒ. එස්. එම්. එස්. මහානාම මහතා විසින් එවන ලද අංක PCC/4/1/12/2019 හා 2020.02.28 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එකී ලිපියේ සඳහන් කරුණු ඔබගේ අවධානයට ලක් කරන ලෙස මට නියම කර ඇත.
අදාල ලිපියේ පිටපතක් මීට අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2020 මැයි මස 14 වෙනි දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය

011-2186055

05 I

ary: } 011-2186057

ANNEXE A-

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ
අමාත්‍යාංශය

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு
அமைச்சு

**Ministry of Women & Child Affairs and Social Security**

ෆැක්ස් / பெக்ஸ் / Fax: } 011-2187249

ඊමේල්/மின் தபால் / Email: secycdwa@gmail.com

වෙබ් අඩවිය/ ,izaj;jsk; / Website: www.childwomenmin.gov.lk

මගේ අංකය. / எனது இல. / My No. } PCC/4/1/12/201?

ඔබේ අංකය. / உமது இல. / Your No. }

දිනය. / திகதி / Date } 2020.02. 28

JUDICIAL SERVICE COMMISSION COLOMBO 12
02 MAR 2020

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

**ළමා රැකවරණ මධ්‍යස්ථානවල නේවාසිකව සිටිනා ළමුන්ට යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී මුහුණදීමට සිදුවන ගැටළු සම්බන්ධවයි**

කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුව 2020.02.06 දින රැස් වූ අතර කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශ විෂය පථයට අදාල කරුණු ගණනාවක් එහිදි සාකච්ඡාවට බඳුන් විය.

මෙහිදි විශේෂයෙන්ම ළමා නිවාසවල සිටිනා අනාථ හා අත්හල ළමුන් පිළිබඳවත් ළමා වින්දිතයින් හා ළමා සාක්ෂිකරුවන් අධිකරණවලදී මුහුණ දෙන ගැටළු පිළිබඳවද සාකච්ඡා විය. එසේ සාකච්ඡා කරනු ලැබූ කරුණු අතුරින් පහත කරුණු ~~දෙක~~ තුන කෙරෙහි ඔබගේ අවදානය යොමු කර එකී ළමුන්ට බලපා ඇති නීතිමය බාධාවන් ඉවත් කර ගැනිමට කටයුතු සලසා ගන්නා ලෙසට අදාළ කමිටුව මවෙත උපදෙස් ලබා දෙන ලදී.

**01. සාක්ෂි විමසීම සඳහා ළමා වින්දිතයින් හා සාක්ෂිකරුවන් වැඩි වාර ගණනක් අධිකරණයට ඉදිරිපත් කිරිමට සිදුවීම**

ළමා වින්දිතයින් හා ළමා සාක්ෂිකරුවන් භාරය හා ආරක්ෂාව සඳහා අධිකරණ නියෝග මත ළමා සුරැකුම් මධ්‍යස්ථාන වෙත යොමු කරනු ලැබේ. එසේ යොමු කරනු ලබන ළමුන් අදාළ නඩු දිනවලට සාක්ෂි විමසීම සඳහා පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු මගින් හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් අධිකරණවලට ඉදිරිපත් කරනු ලබයි. ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සිට අධිකරණවලට ළමුන් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රවාහන කිරීමේදී බන්ධනාගාර දෙපාර්තමේන්තු හරහා ප්‍රවාහනය නොකොට පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු හරහා ළමුන් ප්‍රවාහනය කිරිම සුදුසු බවට පසුගිය කාලයේදී විවිධ පාර්ශව මගින් යෝජනා ඉදිරිපත් විය. බන්ධනාගාර මගින් ළමුන් ප්‍රවාහනය කිරීමේදී ළමුන් ද්විතියික වින්දිතභාවයට ලක්වන බවට චෝදනාද එල්ල විය. මෙකී සියළු කරුණු සලකා බලා අධිකරණවලට ළමුන් ඉදිරිපත් කිරීම සඳහා වන ප්‍රවාහන ක්‍රමය ශක්තිමත් කිරීමට මේ වන විට පියවර ගනිමින් සිටියි.

එසේම විවිධ ප්‍රායෝගික අපහසුතා මධ්‍යයේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු විසින් අධිකරණවලට ළමුන් ඉදිරිපත් කිරීම මේ වන විට සිදු කරනු ලබයි. තත්ත්වය එසේ තිබියදී අධිකරණ නියෝග මත ඇතැම් ළමුන්ව සාක්ෂි විමසීම සඳහා අවම වශයෙන් වාර 10-15ක් අධිකරණවලට ඉදිරිපත් කිරීමට සිදු වූ අවස්ථා වාර්තා වී ඇත.

එසේ ඉදිරිපත් කළද බොහෝ දිනවලදී ඇතැම් ළමුන්ගෙන් කිසිදු සාක්ෂි විමසීමක් සිදු නොකර නඩුව කල් දමනු ලබන අවස්ථා ඇත. මෙසේ සාක්ෂි විමසීමකින් තොරව ළමුන් අධිකරණයට ඉදිරිපත් කිරිම තුළ ළමුන් බරපතල ලෙස මානසික පීඩනයට ලක්වන අතරම ඉතා අවම පහසුකම් යටතේ කටයුතු

කරනු ලබන පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු නිලධාරීන් මෙන්ම බන්ධනාගාර දෙපාර්මේන්තුවද බලවත් අපහසුතාවයට ලක් වේ.

එබැවින් අනිවාර්යෙන්ම සාක්ෂි විමසිමක් සිදු කරන්නේ නම් පමණක් ඊට අදාළ දිනයන්වලදී පමණක් ළමුන් ඉදිරිපත් කිරීමට නියෝග කරන ලෙසට සියළුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

02. **අනාථ හා අත්හල ළමුන් හදාවඩා ගැනීමට ලබාදීමට ඇතැම් මහේස්ත්‍රාත් අධිකරණ මගින් නියෝග නිකුත් නොකිරීම සම්බන්ධව**

ළමා සුරකුම් මධ්‍යස්ථාන වෙත ළමුන් යොමු වන ක්‍රම දෙකක් (02) ඇත. ඉන් එකි ක්‍රමයක් වන්නේ 1941 අංක 22 දරණ අනත්දරු නිවාස ආඥාපනත යටතේ ( වර්ථමානයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය යටතේ) පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන්ට ඇති නෛතික බලතල අනුව අනාථ, අත්හල හා අසරණ ළමුන් ළමා නිවාසගත කරනු ලබයි.

දෙවන ක්‍රමය වන්නේ කිසියම් දරුවෙකු භාරය හා ආරක්ෂාව අවශ්‍ය දරුවෙකු ලෙසට හඳුනාගත් පසුව එම දරුවා අධිකරණයට ඉදිරිපත් කළ පසුව අධිකරණ නියෝග මත ළමයා ළමා නිවාසගත කරනු ලබයි. මෙසේ අධිකරණ නියෝග මත ළමා නිවාස/ රජයේ ආයතන වෙත යොමු කරනු ලබන ළමුන්ව නැවත භාර ගැනීමට දෙමාපියන්/ භාරකරුවන් නොමැති නම් හෝ දරුවා බාර ගැනීම දෙමාපියන්/ භාරකරුවන් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් එකී දරුවන්ව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්ය පරිපාටිය අනුගමනය කරමින් වෙනත් විකල්ප රැකවරණයක් සැපයීමට නැතහොත් හදාවඩා ගැනීමට ලබාදීම සඳහා නැවත එකී අධිකරණයෙන්ම නියෝගයක් ලබා ගැනීමට සිදුවේ.

විශේෂයෙන්ම ළමා ලිංගික අපයෝජනයට ලක්ව ගැබ් ගන්නා ළමා මව්වරුන්ට උපදින් බිළිඳු දරුවන් එකී මව්වරුන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ සිටින අවස්ථාවලදී නඩුවට අදාළ සාක්ෂි විමසා, DNA පරීක්ෂණ ඇතුළු සියළු විමර්ශන අවසන් කරනු ලැබ ඇති අවස්ථාවලදී පවා පරිවාස නිලධාරින් ඉල්ලීම් කර ඇතත් ඇතැම් මහේස්ත්‍රාත්වරුන් එම දරුවන් හදාවඩා ගැනීමට නියෝග ලබා නොදෙන අවස්ථා ඇත.

මේ හේතුවෙන් බිළිඳු දරුවන්ට දීර්ඝ කාලයක් ළමා නිවාසගතව සිටීමට සිදුවීම තුළින් ඔවුන්ගේ වයස මුහුකුරා යන අතර ඉන් පසුව ඔවුන් සුදුසු ඉල්ලුම්කරුවෙකු පවා සොයා ගැනීමට අපහසු වේ. දේශිය ඉල්ලුම්කරුවන් හදාවඩා ගැනීමට අපේක්ෂා කරනු ලබන්නේ ඉතා බිළිඳු දරුවන් වන බැවින් වයස මුහුකුරා ගිය දරුවන්ට සිය ළමා කාලයම ළමා නිවාසගතව සිටීමට සිදුවේ. සිය ස්වාභාවික පවුල නොමැති නම් විකල්ප පවුලක හැදි වැඩීමට ළමයාට ඇති අයිතිය මෙමගින් ගිලිහී යන අතර නිසි වයසේදී ලැබිය යුතු ප්‍රාථමික සමාජානුයෝජනය මෙන්ම පූර්ව ළමා සංවර්ධනයට ඇති ඉඩකඩ මෙමගින් ඇහිරී යනු ඇත.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබන බොහෝමයක් ආඥාපනත් යටත්විජිත සමයේ සම්මත කරගත් නීති වන අතර එය කාලානුරූපව සමාජ අවශ්‍යතා අනුව සංශෝධනයට ලක් විය යුතු බවට නිරීක්ෂණය වී ඇත. එසේම 1987 වසරේදී පළාත්සභා ක්‍රමය ක්‍රියාත්මකවීමත් සමඟ පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයද මුළුමනින්නම විමධ්‍යගත වී ඇත. එබැවින් පළාත් මට්ටමින් අනපනත් සම්මත කර ගත යුතුවේ. (Provincial Statute). මෙම තත්ත්වය මත ළමුන් සම්බන්ධ තීරණ ගැනීමේදී අධිකරණයද යම් අපහසුතාවයන්ට මුහුණ දෙන බවද පෙනේ.

එහි පළමු පියවරක් ලෙසට ළමුන් හදාවඩා ගැනීමට ලබාදීමට (කුලවද්දා ගැනීමට) නෛතික ප්‍රතිපාදන ඇති 1941 අංක 24 දරණ ළමුන් හදාවඩා ගැනීමේ ආඥාපනතේ හා ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥාපනතේ ගැටළු සහගත තත්ත්වයන් ඇති අතර ඒ පිළිබඳව අධ්‍යනය කරමින් එකී ආඥාපනත්වලට සංශෝධන ගෙන ඒමට මේ වන විට කටයුතු කරමින් සිටියි. එහෙත් ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. එසේ වුවද අනාථ හා අත්හල ළමුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නොපමාව රජය මැදිහත්ව කටයුතු කළ යුතු වේ.

එබැවින් ඉහත තත්ත්වයන් සැලකිල්ලට ගෙන අධිකරණ නියෝග මත ළමා නිවාසගත කරනු ලබන ළමයින් නැවත සමාජගත කිරීමේ අපේක්ෂාවෙන් (හදාවඩා ගැනීමට ලබාදීමට) පරිවාස නිලධාරීන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවලදී ළමයාගේ අධීක්ෂණමය සිද්ධියට අදාළව සියළුම නෛතික අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් හා එකී ඉල්ලීම් පිළිබඳව ගරු මහේස්ත්‍රාත්වරුන් සෑහීමකට පත් වන්නේ නම් එම දරුවන්ගේ "උපරිම යහපත" යන සංකල්පය සැලකිල්ලට ගෙන එකී දරුවන්ට විකල්ප රැකවරණයක් සැලසීමට හැකිවන පරිදි පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් වෙත නියෝග නිකුත් කරන ලෙසට සියළුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**03. පරිවාස නිලධාරී නිර්දේශ මත ළමුන් ළමා නිවාසවලට යොමු කිරීම**

ඇතැම් අවස්ථාවලදි අධිකරණ විසින් පරිවාස නිලධාරීන්ගේ නිර්දේශ ලබා නොගෙන ළමුන්ව ළමා නිවාසවලට ඇතුළු කරනු ලබන අවස්ථා ඇති අතර එතුළින් ළමයින්ට විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුවන බවට වාර්තා වී ඇත. එම නිසා ළමුන් ආයතනගත කිරීමට අධිකරණ නියෝග ලබාදීමට ප්‍රථම ඒ පිළිබඳව සෑම අවස්ථාවකදීම අදාළ පරිවාස නිලධාරීන් සමඟ සාකච්ඡා කොට පරිවාස නිලධාරී නිර්දේශ මත සුදුසු නිවාසවලට එම ළමුන් යොමු කිරීමට ගරු අධිකරණය පියවර ගනු ලබන්නේ නම් ළමුන්ට මෙන්ම කාර්ය මණ්ඩලවලට ඇතිවන ගැටළු බොහෝමයක් මගහැර ගැනීමට හැකිවනු ඇත.

මේ සම්බන්ධයෙන් ඔබගේ යහපත් හා ඉක්මන් ප්‍රතිචාරය ඉතා අගය කොට සලකමි.

ජේ.එස්.එම්.එස්.මහානාම
ලේකම්

පිටපත : සියළුම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් වෙත } කාරුණික දැන ගැනීම සඳහා